(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(2).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 නොවැම්බර් 18 බදාදා**

---

**2020 නොවැම්බර් 30 සඳුදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/2020

ගරු හේෂා විතානගේ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත් —

(i) කාර්මික ජනපද සංඛ්‍යාව;

(ii) බිම් ඒකක සංඛ්‍යාව;

(iii) කාර්මික ජනපදවල ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව;

(iv) කාර්මික ජනපදවල සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2017 වර්ෂයේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මධ්‍යම පළාත වෙනුවෙන් —

(i) ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කළ වැඩසටහන්;

(ii) එම වැඩසටහන පැවැත් වූ ස්ථාන;

(iii) ලබා දී ඇති උපකරණ;

(iv) ප්‍රතිලාභීන් තෝරාගත් පදනම;

(v) සිදු කරනු ලැබූ තාක්ෂණික පුහුණු වැඩසටහන්;

කවරේද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ විද්‍යුත් ව්‍යාපාර සිදුකිරීමේ හැකියාව ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා ද විවෘතව පවතින නමුත්, ඒ සඳහා අවශ්‍ය දැනුම ප්‍රමාණවත් පරිදි ලබා දී නොමැති බව පිළිගන්නේද;

(ii) මෙම දැනුම විධිමත්ව ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

100/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ජනතාවගේ නීති ගැටලු කඩිනමින් විසඳීමටත්, නීති උපදෙස් ලබා ගැනීමටත්, එක් මහේස්ත්‍රාත් අධිකරණ බලප්‍රදේශයක් සඳහා අවම වශයෙන් එක් නීතිඥ වෘත්තිකයෙකු, පොලිස් නඩු මෙහෙයවීමේ නිලධාරි (prosecutor) ලෙස අදාළ බලප්‍රදේශය වෙනුවෙන් පත් කිරීම තුළින් ශ්‍රී ලංකා පොලීසියෙන් සේවය ලබා ගන්නා ජනතාවට විශාල සේවයක් සිදු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) උක්ත නව තනතුර ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, එම අදාළ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

119/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ පිවිසුම් මාර්ගය ඉදිකිරීමේදී හානියට පත්වන දේපළ හා ඒ වෙනුවෙන් අත්කර ගනු ලබන ඉඩම්වලට වන්දි ගෙවීමක් සිදු කරන්නේද;

(ii) එසේ නම්, එම වන්දිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා තක්සේරුකර ඇති වන්දි ප්‍රමාණය කොපමණද;

(iv) මේ සම්බන්ධව ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් වෙත මේ වනවිට ප්‍රතිපාදන නිදහස් කර තිබේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

(vi) එම ප්‍රතිපාදන නිදහස් කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

214/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ලුණු ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම ලුණු ආනයනය කළ රටවල්;

(iv) එම ලුණු ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ලුණු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

252/2020

ගරු වේලු කුමාර් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හන්තාන වතුයාය මහනුවර දිස්ත්‍රික්කයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතුයායක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1992 දී රජය සතුව පැවති වතු ප්‍රතිසංස්කරණය කළ අවස්ථාවේදී මෙම වතුයායට අයත්ව තිබූ කොටස් (Division) සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොටස්වල නම් කවරේද;

(iii) 2015 වනවිට අතහැර දැමූ හෝ වසා දමා ඇති කොටස් තිබේද;

(iv) එසේ නම්, එම කොටස්වල ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 1992 සිට 2015 දක්වා කාලයේ දී මෙම වතුයායට අයත් ඉඩම්, කර්මාන්ත ශාලාව සහ වෙනත් ගොඩනැගිලි බාහිර පාර්ශ්වයට / පුද්ගලික අංශයට ලබා දුන්නේද;

(ii) එම විස්තර කවරේද;

(iii) අවසන් වරට සිදුකළ සංගණනයට අනුව වගා කළ ඉඩම් හා වගා නොකළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

453/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 215 දිවුල්වැව ග්‍රාම නිලධාරි වසමේ, බඹරඇල ග්‍රාමයේ 1973 වර්ෂයේ සිට හේන් ගොවිතැන් කරන ලද ගොවීන්ගේ සින්නක්කර ඔප්පු සහිත ඉඩම්වලට වනජීවී නිලධාරින් පැමිණ රක්ෂිත මායිම් සළකුණු කර මායිම් කණු දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

608/2020

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ වැඩිහිටි නිවාස සම්බන්ධයෙන් නියාමනයක් සිදු කරනු ලබන්නේද;

(ii) එම නිවාස සම්බන්ධයෙන් ප්‍රමිතියක් තිබේද;

(iii) එසේ ප්‍රමිතියට අනුකූල නොවන වැඩිහිටි නිවාස නවීකරණය කිරීම සඳහා පියවර ගනු ලබන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන එක් එක් වැඩිහිටි නිවාස අතරින් රජය, පුද්ගලික අංශය සහ රජය හා පුද්ගලික අංශය ඒකාබද්ධව පවත්වා ගෙන යනු ලබන වැඩිහිටි නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

780/2020

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) එවකට පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ වවුනියාව ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ නිවාස යෝජනා ක්‍රමය යටතේ නිවාස අහිමි පුද්ගලයන්ට නිවාස ලබා දෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 42 අතරින් නිවාස ලබා දීම සඳහා 2019 වර්ෂයේදී හඳුනාගෙන ඇති ප්‍රතිලාභින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත එක් එක් ග්‍රාම නිලධාරි වසම සඳහා මේ වනතෙක් ලබා දී ඇති නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම නිවාසලාභින්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එක් එක් ග්‍රාම නිලධාරී වසම සඳහා නිවාස වෙන් කරන පදනම කවරේද;

(ii) කල්ලිකුලම් ග්‍රාම නිලධාරී වසමේ මුල් පදිංචිකරුවන්ට සහ පසුව පදිංචි කරවනු ලැබූ අයට නිවාස වෙන් කිරීමේදී පදනම් කර ගනු ලැබූ සාධක කවරේද;

(iii) එම නිවාස වෙන් කිරීමේදී පැන නැඟී ඇති ගැටලුව විසඳීමට ගනු ලබන පියවර කවරේද;

(iv) මේ වනතෙක් නිවාස ලැබී නොමැති පුද්ගලයන්ට නිවාස ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 දෙසැම්බර් 01 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

49/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් අතරින් දැනට උසස් පෙළ තාක්ෂණික විෂය ධාරාව හැදෑරීමේ පහසුකම් ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) උසස් පෙළ තාක්ෂණික විෂයධාරාව හැදෑරීමේ පහසුකම් තවදුරටත් බදුල්ල දිස්ත්‍රික්කය තුළ පුළුල් කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

149/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටි එකම මිශ්‍ර ජාතික පාසල වන කුඩාබුත්ගමුව ශ්‍රී රාජසිංහ විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉතිහාසය, පුරවැසි අධ්‍යාපනය, නාට්‍ය හා රංග කලාව යන විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු 02 බැගින්ද, දෙමළ භාෂාව, චිත්‍ර කලාව, තොරතුරු තාක්ෂණය, මාධ්‍ය, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණ විද්‍යාව, ගිණුම්කරණය, සන්නිවේදන හා මාධ්‍ය, බෞද්ධ ශිෂ්ටාචාරය යන විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු 01 බැගින්ද, ශිෂ්‍ය උපදේශනය, ගුරු පුස්තකාල තනතුරුවල පුරප්පාඩු 01 බැගින් ද පවතින බවත්;

(ii) අනධ්‍යයන කාර්ය මණ්ඩලය තුළද සනීපාරක්ෂක කම්කරු, උද්‍යාන කම්කරු සහ සාමාන්‍ය කම්කරු තනතුරුවල පුරප්පාඩු 02 බැගින්ද, විද්‍යාගාර සහායක තනතුරේ පුරප්පාඩු 03 ක් ද, කළමණාකරණ සහකාර තනතුරේ පුරප්පාඩු 01ක් ද පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශයට ඇති සැලසුම් සහ එම පුරප්පාඩු පුරවන ලබන නිශ්චිත දින වකවානු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

190/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන්මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ ඇති ක්‍රිකට් සංගම් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති පරිපාලන දිස්ත්‍රික්ක 25 සඳහා ක්‍රිකට් සංගම් 25ක් තිබෙන බවත්;

(ii) කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අනුමතිය ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අනුමතිය ලබා නොදීමට;

(ii) තම ලියාපදිංචිය ඉල්ලා කිළිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය අවස්ථා ගණනාවකදීම අයදුම් කර ඇතත් මෙතෙක් ලියාපදිංචි නොකිරීමට;

හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) 2010 වර්ෂයෙන් පසුව කිළිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ලබාදී ඇති ආධාර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

204/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) හෘදය සැත්කම් සිදු කර ගැනීම සඳහා රෝගීන් දහස් ගණනක් වසර ගණනාවක් තිස්සේ රජයේ රෝහල්වල පොරොත්තු ලේඛනයේ සිටින බවත්;

(ii) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පෞද්ගලික රෝහල්වලින් එම සැත්කම් සිදු කර ගැනීම සඳහා රුපියල් මිලියන ගණනක් දැරීමට සිදු වන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එසේ නම්,

(i) පසු ගිය වසර පහක කාලය තුළදී ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ හෘද ආශ්‍රිත රෝග සංඛ්‍යාව කොපමණද;

(ii) හෘදය සැත්කම් සිදු කර ගැනීම සඳහා පසු ගිය වසර පහක කාලය තුළදී රජයේ රෝහල්වල ලියාපදිංචි වී ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද; සහ

(iii) එසේ ලියාපදිංචි වූ රෝගීන් සඳහා පසු ගිය වසර පහ තුළදී වාර්ෂිකව සිදු කරන ලද සැත්කම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්තමානයේදී අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය පිළිබඳව රජය සෑහීමකට පත්වන්නේද; සහ

(ii) දැනට පවත්නා මෙම තත්ත්වය වැඩිදියුණු කර ගැනීම පිණිස ඒ සම්බන්ධයෙන් සිදු කර ඇති ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

303/2020

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන සඳහා වූ රාජ්‍ය අමාත්‍යාංශයක් පිහිටුවා ඇති පසුබිමක —

(i) ශ්‍රී ලංකාව තුළ බහු විවෘත විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට රජය අරමුණු කර තිබේද;

(ii) රජය විසින් දුරස්ථ ඉගෙනුම් අවස්ථා පුළුල් කිරීමට අදහස් කරන්නේ, උසස් අධ්‍යාපනය ලැබීමට බලාපොරොත්තු වන කවර කණ්ඩායම් ඉලක්ක කරගෙනද;

(iii) දුරස්ථ අධ්‍යාපන අවස්ථා සඳහා සහනාධාර ලබා දීමට ඉදිරියේදීත් රජය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා එහි අරමුදල් යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තවදුරටත් ක්‍රියාත්මක වන්නේද;

(ii) නොඑසේ නම්, එය පාලනයට නතු කරනු ලබන අධිකාරිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?;

(ඇ) (i) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කටයුතු සඳහා වෙන් කර ඇති අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) විශ්ව විද්‍යාලය සඳහා දරනු ලබන වියදමින් රජය විසින් දරනු ලබන ප්‍රමාණය කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

428/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දෛනික විදුලි පරිභෝජනය දළ වශයෙන්;

(ii) මේ සඳහා වන විදුලිය අවශ්‍යතාවය උත්පාදනය කරන ප්‍රභවයන්;

(iii) ජාතික විදුලිබල පද්ධතියට ඉහත එක් එක් ප්‍රභවයෙන් උත්පාදිත විදුලිය, ප්‍රතිශතයක් ලෙස;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2021 වර්ෂය වනවිට රජයේ මැදිහත්වීමෙන් උත්පාදනය කරන විදුලිය ප්‍රමාණය, 2025 වර්ෂය වනතෙක් ප්‍රමාණවත් වන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

482/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දැඩි මූල්‍ය අර්බුදයකට ලක් වී තිබෙන බවත්;

(ii) ඒ හේතුවෙන් සේවක වැටුප් ගෙවීමට පවා දුෂ්කර වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මේ වනවිට සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන්ට අඩ වැටුප් සමඟ මාස තුනක් නිවාඩු ලබා දීමට තීරණය කර තිබේද;

(iii) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

548/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල, බෙලිගහ හන්දියේ ඉදිකරමින් පවතින නව අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු මන්දගාමීව සිදුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේද;

(ii) ඒ සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන මේ වනවිට පවතින්නේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපුරා ගන්නා මූලාශ්‍ර කවරේද;

(iv) එසේ මූල්‍ය ප්‍රතිපාදන සපුරාගත් පසු එහි වැඩකටයුතු කඩිනම් කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 දෙසැම්බර් 02 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

17/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ දිසා අධිකරණ වෙත යොමු වී ඇති පැමිණිලි අතරින්, මෙතෙක් විභාග නොවූ සහ විභාග වෙමින් පවතින නඩු තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, අදාළ නඩු අංක සහ ඒවා පැවරූ දින වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත නඩු වලින් —

(i) වසර 01 – 05 අතර;

(ii) වසර 05 – 10 අතර;

(iii) වසර 10 – 15 අතර;

(iv) වසර 15 -20 අතර;

(v) වසර 20 – 25 අතර;

(vi) වසර 25කට වඩා වැඩි;

කාලයක් විභාග වන පැරණි නඩු කවරේදැයි අදාළ නඩු අංක හා පැවරූ / ලේඛනගත වූ දින සමඟ වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

105/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2017.01.01 සිට 2019.01.01 දක්වා ශ්‍රී ලංකා පොලීසිය, පොලිස් විශේෂ කාර්ය බලකාය සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන එක් එක් ආයතන විසින් —

(i) සිදු කරන ලද කෘත්‍රිම රා වැටලීම් සංඛ්‍යාව;

(ii) අත්අඩංගුවට ගත් කෘත්‍රිම රා ලීටර් ප්‍රමාණය;

(iii) සිදු කරන ලද වැටලීම් මඟින් අයවූ දඩ මුදල්වල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඇතැම් රා නිෂ්පාදකයන්ට අනුමත ප්‍රමාණයට වඩා ගබඩා පහසුකම් පවතින බවත්;

(ii) ඔවුන් කෘත්‍රිම රා නිෂ්පාදනය කර ගබඩා කරන බවත්;

(iii) පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් කෘත්‍රිම රා අත්අඩංගුවට ගත්තද, ඇතැම් සුරාබදු නිලධාරින් විසින් ඒවා අධිකරණයට ඉදිරිපත් නොකර, තාක්ෂණික දෝෂ ලෙස පෙන්වා සමථ ගාස්තුවකට යටත්ව වැරදිකරුවන් නිදහස් කරන බවත්;

(iv) කෘත්‍රිම රා නිෂ්පාදනය, තාක්ෂණික දෝෂයක් නොව, ඇතැම් සුරාබදු නිලධාරින් විසින් චේතනාන්විතව එම නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමක් බවත්;

(v) මෙමඟින් රජයට විශාල බදු මුදලක් අහිමි වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) කෘත්‍රිම රා නිෂ්පාදනය නැවැත්වීමට අදාළ නීති, සංශෝධනයට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

217/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ මුං ඇට ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම මුං ඇට ආනයනය කළ රටවල්;

(iv) එම මුං ඇට ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට මුං ඇට ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

254/2020

ගරු වේලු කුමාර් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ග්‍රේට් වැලි වතුයාය, මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතුයායක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1992 දී රජය සතුව පැවති වතු ප්‍රතිසංස්කරණය කළ අවස්ථාවේදී මෙම වතුයායට අයත්ව තිබූ කොටස් (Divisions) සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොටස්වල නම් කවරේද;

(iii) 2015 වනවිට අතහැර දැමූ හෝ වසා දමා ඇති කොටස් තිබේද;

(iv) එසේ නම්, එම කොටස්වල ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 1992 සිට 2015 දක්වා කාලයේ දී මෙම වතුයායට අයත් ඉඩම්, කර්මාන්ත ශාලාව සහ වෙනත් ගොඩනැගිලි බාහිර පාර්ශ්වයට / පුද්ගලික අංශයට ලබා දුන්නේද;

(ii) එම විස්තර කවරේද;

(iii) අවසන් වරට සිදුකළ සංගණනයට අනුව වගා කළ ඉඩම් හා වගා නොකළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

450/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය (International Committee of the Red Cross - ICRC) හරහා පකිස්ථානයේ හා ඇෆ්ගනිස්ථානයේ සිට මෙරටට පැමිණි සරණාගතයන් සංඛ්‍යාව;

(ii) එම සරණාගතයන් දැනට රඳවා සිටින ස්ථාන;

(iii) එම සරණාගතයන්ට ලබාදෙන පහසුකම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙසේ වෙනත් රටවල සරණාගතයන් ශ්‍රී ලංකාවට භාරගැනීම හේතුවෙන් මෙරටේ සමාජ, ආර්ථික දේහයට දැඩි බරක් පැටවෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

517/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධීවර කර්මාන්තයේදී හැඹිලි දැල් භාවිතා කිරීම සඳහා යම් සීමාවකට යටත්ව අවසර දී ඇතත් ධීවරයින් එය නිසි අයුරින් භාවිතා නොකිරීම හේතුවෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල වෙරළ ආසන්නයේ ධීවර කර්මාන්තයේ යෙදෙන දේශීය ධීවරයින්ගේ ජීවනෝපායට දැඩි බලපෑම් එල්ල වී ඇති බවත්;

(ii) මෙය පාලනය කිරීම අසීරු කාර්යයක් වී ඇති හෙයින් නව තාක්ෂණය භාවිතා කරමින් විසඳුම් ක්‍රියාත්මක කිරීම අනිවාර්යය වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

525/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි ක්‍රීඩා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) මේ වනවිට එම පාසල්වල සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ක්‍රීඩා පාසල් තවදුරටත් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

610/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) කුලියාපිටිය මූලික රෝහල, ශික්ෂණ රෝහලක් බවට පත් කර ඇති බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම රෝහල ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය පීඨයේ සායනික පුහුණුවීම් සඳහා යොදාගැනීමට කටයුතු කරන්නේද;

(ii) මේ සම්බන්ධව කරුණු අධ්‍යයනය කිරීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර ඇති බව දන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය හා කුලියාපිටිය ශික්ෂණ රෝහල සම්බන්ධව මහාචාර්ය ඒකකයක් පිහිටුවා තිබේද;

(ii) එම ඒකකය කුලියාපිටිය රෝහලේ ස්ථාපනය කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 දෙසැම්බර් 03 බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

53/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා රජය සතුව ඇති සංස්ථා, මණ්ඩල, අධිකාරි වැනි ව්‍යවස්ථාපිත ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ආයතනවල දැනට සිටින සභාපතිවරුන් හා අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) එම සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

(v) එකී ආයතන මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

160/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීතොටමුල්ල කසළ කන්ද පිහිටි භූමිය නාගරික උද්‍යානයක් බවට පත් කිරීමේ කටයුතු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය;

(ii) එම ප්‍රතිපාදන යොදවා මේ වනවිට වැඩ අවසන් කර ඇති ප්‍රමාණය;

(iii) තවදුරටත් වැඩ නිම කිරීමට ඇති ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

191/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිළිනොච්චි නගර මධ්‍යයේ පිහිටා ඇති පොදු ක්‍රීඩාංගණය, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක් ලෙස සංවර්ධනය කිරීමට 2010 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර මේ වනවිට දස වසරක් ගත වී තිබුණ ද, එම ක්‍රීඩාංගණය දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ගේ ප්‍රයෝජනය සඳහා මේ දක්වා භාර දී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රීඩාංගණය, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක්ද; නොඑසේ නම්, දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩාංගණයක්ද;

(ii) ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) ඉහත මුදලින් පසුගිය වර්ෂ 10 තුළදී වැය කර ඇති මුදල කොපමණද;

(iv) ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත් අත්සන් කර ඇති කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(v) කොන්ත්‍රාත් කටයුතු සිදු කරන වර්තමාන කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රමාදය, දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ගේ ක්‍රීඩා කටයුතුවලට කෙතරම් දුරට බලපා තිබේද;

(ii) දිස්ත්‍රික්කයේ ක්‍රීඩා ක්ෂේත්‍රය නංවාලීමට අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

419/2020

ගරු වරුණ ලියනගේ මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව ජීවත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට නිවාස තනා ගැනීම සඳහා ඉඩම් ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඉඩම් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පවුල්වලට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එසේ ඉඩම් ලබා දී ඇති පවුල්, අයත්වන වතු සමාගම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉඩම් නොමැති වතු ආශ්‍රිතව ජීවත් වන පවුල් සඳහා ඉඩම් ලබාදීමට රජය ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

421/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට බොහෝ දුරට වැඩ නිමවෙමින් පවතින ''විසල් මාතලේ'' ජල ව්‍යාපෘතිය යටතේ ගෘහ ජල සම්බන්ධතා ලබා දීමට නියමිත උකුවෙල, රත්තොට, මාතලේ, යටවත්ත හා පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කවරේද;

(ii) එම ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය යටතේ ගෘහ ජල සම්බන්ධතාවයන් ලබා දීම සඳහා ආවරණය නොවන ග්‍රාම නිලධාරි වසම් ගණනාවක් ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල තිබෙන බව දන්නේද;

(ii) එම ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල ගෘහ ජල සම්බන්ධතා ලබා නොදෙන ගම්මාන සංඛ්‍යාව කවරේද;

(iv) එම ගම්මානවල නම් කවරේද;

(v) එම ගම්මාන සඳහා ද ගෘහ ජල සැපයුම් සම්බන්ධතාවය ලබාදීමට ඉහත ව්‍යාපෘතිය යටතේ පියවර ගන්නේද;

(vi) නොඑසේ නම්, ඒ සඳහා විකල්ප යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

429/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා පොලීසිය මගින් ඉමහත් සේවාවක් ඉටු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් ස්ථාන නවීකරණය කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අලව්ව පොලිස් ස්ථානය නවීකරණය කළ යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

483/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකාවේ වගා බිම්වල පලිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතය පිළිබඳ පර්යේෂණයක් සිදු කර තිබෙන බවත්;

(ii) පලිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතකර වගා කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටින රටක් බවට පත්ව තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) පලිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතකර වගා කටයුතු සිදුකිරීම අවම කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

781/2020

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2015 දක්වා එවකට ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා තරුණ කටයුතු අමාත්‍යාංශය වෙත පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ කටයුතු වෙනුවෙන් විවිධ රටවලින් සහ ආයතනවලින් ලැබුණු හා මිලදී ගත් වාහන වර්ග, ඒවායේ ලියාපදිංචි අංක සහ ඒවා භාවිතය සඳහා ලබා දෙන ලද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වෙන් වෙන් වශයෙන්;

(ii) එම වාහනවල වත්මන් ක්‍රියාකාරීත්වය;

(iii) මේ වනවිට එම වාහන භාවිතා කරනු ලබන ආයතන;

(iv) මේ වනවිට තලෙයිමන්නාරම පොලිසියේ රඳවා ගෙන ඇති WP RB - 2639 ලියාපදිංචි අංකය දරන ට්‍රැක්ටර් රථය භාවිතා කරන ලද අමාත්‍යාංශය හා එහි අදාළ අංශය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට 2012 දක්වා මැණික් ෆාම් අතරමැදි කඳවුරෙහි භාවිතා කළ වාහනවල වර්ග හා ලියාපදිංචි අංක;

(ii) මේ වනවිට එම වාහන භාවිතා කරනු ලබන ආයතනය හා ස්ථානය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 දෙසැම්බර් 04 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

21/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අපරාධ මැඩලීමේ කටයුතුවල යෙදී සිටියදී, 2015 වර්ෂයේ සිට ඝාතනය වූ පොලිස් නිලධාරීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) එම පොලිස් නිලධාරීන් ඝාතනය වීමට හේතු කවරේද;

(iii) එම නිලධාරීන්ගේ අඹුදරුවන් ආරක්ෂා කිරීමට පොලිස් දෙපාර්තමේන්තුව ගෙන ඇති පියවර කවරේද;

(iv) නිලධාරීන්ගේ ජීවිතාරක්ෂාව සහ ඔවුන්ගේ අඹුදරු රැකවරණය සම්බන්ධයෙන් පවතින ක්‍රමවේදය වර්ධනය කිරීමට ඉදිරියේදී කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එය සිදු කරනු ලබන කාලසීමාව සහ ක්‍රමවේදය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අපරාධ මැඩලීමේ කටයුතුවල යෙදී සිටියදී 2015 වර්ෂයේ සිට ඝාතනය වූ පොලිස් නිලධාරීන්ගේ අඹුදරුවන් වෙනුවෙන් ගෙවන ලද දීමනාවල වටිනාකම කවරේද?

(ii) ඔවුන්ගේ වැන්දඹු අනත්දරු දීමනා නිසි පරිදි ගෙවා තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඝාතනයට ලක්වීමෙන් පසු;

(i) උසස්වීම් ලබා දී ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) උසස්වීම් ලබා දී නොමැති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) උසස්වීම් ලබා දී නොමැති නිලධාරීන් සඳහා උසස්වීම් ලබා නොදීමට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

106/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ රා කර්මාන්තය ව්‍යාප්තව ඇති දිස්ත්‍රික්ක කවරේද;

(ii) එම කර්මාන්තය ජීවනෝපාය කරගත් පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2019/12/31 දිනට ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී රා නිෂ්පාදනය කරන පුද්ගලයන්/ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිෂ්පාදනාගාරයට අදාළ අනුමත ධාරිතාවයන් ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම ධාරිතාවයන් එක් එක් ආයතනයට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රා කර්මාන්තයේ නියුක්තවන්නන්ගේ සුභසාධනය වෙනුවෙන් රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

224/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ යන්ත්‍රෝපකරණ ප්‍රමාණය කොපමණද;

(ii) එම යන්ත්‍රෝපකරණ ආනයනය කළ රටවල් කවරේද;

(iii) එම යන්ත්‍රෝපකරණ ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට යන්ත්‍රෝපකරණ ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

255/2020

ගරු වේලු කුමාර් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බෝපිටිය වතුයාය, මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතුයායක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1992 දී රජය සතුව පැවති වතු ප්‍රතිසංස්කරණය කළ අවස්ථාවේදී මෙම වතුයායට අයත්ව තිබූ කොටස් (Divisions) සංඛ්‍යාව කොපමණද?

(ii) එම කොටස්වල නම් කවරේද;

(iii) එම වත්තේ සම්පූර්ණයෙන්ම වගා කළ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) 2015 වර්ෂය වනවිට ඉහත වතුයායේ අතහැර දැමූ කොටස් තිබේද;

(v) එසේ නම්, එම කොටස්වල මුළු බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 1992 සිට 2015 දක්වා, කාලයේදී මෙම වතුයායට අයත් ඉඩම් සහ ගොඩනැගිලි බාහිර පර්ශ්වයට / පුද්ගලික අංශයට ලබා දුන්නේද;

(ii) එම විස්තර කවරේද;

(iii) අවසන් වරට සිදුකළ ඉඩම් සංගණනයට අනුව වගා කළ ඉඩම් හා වගා නොකළ ඉඩම් ප්‍රමාණය නොපමණද;

යන්නත් වෙන් වෙන් වශයෙන් දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

500/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති ගම්මාන අතරින් පානීය ජල දුෂ්කරතා ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) එම ගම්මානවල පානීය ජල ගැටලුව විසඳීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

559/2020

ගරු මයන්ත දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් ආරම්භ කරන ලද "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් ආරම්භ කරන ලද පාසල් ගොඩනැගිලි සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති එක් එක් පාසල සඳහා ලබා දී ඇති ගොඩනැගිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතරින් වැඩ අවසන් කර තිබෙන ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iv) වැඩ අවසන් නොකරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම ව්‍යාපෘතිය සඳහා වියදම් වූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම ව්‍යාපෘතිය නතර කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්නත් එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

578/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කයෙන් පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාණය උතුරු පළාතේ සමස්ත භූමි ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙලෙස ඉඩම් පවරා ගැනීමේදී, පෞද්ගලික ඉඩම්, කෘෂිකාර්මික වැව්, කෘෂිකාර්මික ඉඩම් සහ පශු සම්පත් සඳහා වූ තෘණ භූමි ඉඩම් ද පවරාගෙන ඇති අතර එය ජනතාවගේ ජීවනෝපායට මෙන්ම සහජීවනයටද අහිතකර ලෙස බලපෑම් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) උක්ත ඉඩම් පවරා ගැනීමේදී දිස්ත්‍රික් ලේකම්වරයාගේ, ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහ පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා නොගැනීමට හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

776/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුලියාපිටිය මැතිවරණ කොට්ඨාසයේ පිහිටි ජාතික පශු සම්පත් මණ්ඩලයට අයත් නාරංගල්ල වතුයායට අයත් ඉඩමක පසුගිය රජය සමයේ තාක්ෂණ පීඨයක් ආරම්භ කිරීමට මුල්ගල තැබූ බවත්;

(ii) මෙම තාක්ෂණ පීඨය ආරම්භ කිරීමට මුල්ගල තැබූ ඉඩම මේ වනවිට වල් බිහි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තාක්ෂණ පීඨය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ කවරේද;

(ii) තාක්ෂණ පීඨය මේ වනතෙක් ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(iii) එම මුල්ගල තැබීමේ උත්සවය සඳහා වැයකළ මුදල කොපමණද;

(iv) මේ සඳහා වෙන්කළ ඉඩම මේ වනවිට අධ්‍යාපන අමාත්‍යාංශයට පවරා ගැනීමක් සිදු කර ඇත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 දෙසැම්බර් 05 සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

60/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ක්‍රිකට් විශ්වවිද්‍යාලයක් ඉදිකිරීමට සැලැස්මක් සකස් කර තිබුණේද;

(ii) ඒ සඳහා මහනුවර ප්‍රදේශයෙන් ඉඩමක් මිලදී ගැනීමට මුදල් වියදම් කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා වියදම් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ඉඩම මිලදී ගැනීමේදී විශාල මූල්‍ය වංචාවක් සිදු කර ඇති බව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කර ඇති වාර්තා මඟින් පෙන්වා දී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

166/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ඔප්පු හිමිකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

422/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ හතරවන අදියරෙහි (කුරුණෑගල - දඹුල්ල) වර්තමාන තත්ත්වය මෙම සභාවට දන්වන්නේද;

(ii) ඉහත ව්‍යාපෘතිය හේතුවෙන් දේපළ අහිමි වන්නන් සඳහා ගෙවනු ලබන වන්දි මුදල පිළිබඳව මේ වනවිට නිශ්චය කර තිබේද;

(iii) එසේ නම්, එය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iv) ඉහත ව්‍යාපෘතිය හේතුවෙන්, විහාර සන්තක දේපළ භුක්ති විඳින්නන්ගේ අහිමිවන දේපළ සඳහා වන්දි ගෙවනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා වන්දි ගෙවීමේදී—

(i) භූමිය සඳහා ගෙවීම් කරන අනුපාතය;

(ii) සංවර්ධන වටිනාකම සඳහා ගෙවීම් කරන ආකාරය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

430/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ වයඹ පළාත තුළ දැදුරු ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා වැය කළ/කරන මුදල කවරේද;

(ii) ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයාගත් ප්‍රභවයන් කවරේද;

(iii) ව්‍යාපෘතිය සඳහා ඉඩම් පරිත්‍යාග කළ පවුල් සංඛ්‍යාව කවරේද;

(iv) එම පවුල් සඳහා ප්‍රමාණවත් වන්දි මුදලක් ගෙවීමට කටයුතු කළේද;

(v) එම පවුල් සඳහා වන්දි ගෙවීම වෙනුවෙන් වැයකර තිබෙන මුදල කවරේද;

(vi) මේ වනතෙක් වන්දි ගෙවා නොමැති පවුල් සඳහා වන්දි ගෙවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

491/2020

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ආනවිලුන්දාව කුරුළු අභය භූමිය (රම්සා තෙත්බිම) තුළ දැනට අනවසර ඉස්සන් වගාව සිදුවන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ප්‍රදේශය තුළ, ඉස්සන් වගාව සිදු කරන ලද කොටු අත්හැරීම මෙන්ම, ඒවා නැවත ප්‍රතිසංස්කරණය කරමින් භාවිතා කරන බව එතුමා පිළිගන්නේද;

(ii) ඉහත අනවසර ඉස්සන් වගාව නවතා දැමීමට ගනු ලැබූ පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

518/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1973 දී පමණ ආරම්භ කර දැනට වසර තුනකට අධික කාලයක සිට අක්‍රියව පවතින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලයට යාබදව පිහිටා ඇති අයිස් කර්මාන්ත ශාලාව නැවත ප්‍රතිසංස්කරණය කර ක්‍රියාත්මක කළ යුතු බවත්;

(ii) එමගින් ධීවර බෝට්ටු සහ මාළු දැල් උපයෝගී කර ගනිමින් ධීවර කර්මාන්තයේ නිරත වන සහ ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයේ නිරත වන දේශීය ධීවරයන්ට සෙත සැලසෙන අතර ඔවුන්ගේ ජීවනෝපායද ඉහළ නැංවීමට අවස්ථාව උදාවන බවත්;

(iii) එහි පවතින ගබඩා පහසුකම් නිසා ශික්ෂණ රෝහලට සහ වෙනත් විවිධ ආයතනවලට අවශ්‍ය මුහුදු ආහාර ගබඩා කර බෙදාහැරීම සිදු කළ හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අයිස් කර්මාන්තශාලාව ප්‍රතිසංස්කරණය කර නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

521/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සහකාර පොලිස් අධිකාරී තනතුරේ පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවූයේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සම්මුඛ පරීක්ෂණය සඳහා නිලධාරින් කැඳවූයේද;

(ii) එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ ක්‍රමවේදය කවරේද;

(iii) සම්මුඛ පරීක්ෂණය කැඳවා තිබූ කාලය තුළ ලකුණු ලබාදීමේ ක්‍රමවේදය සංශෝධනය කළේද;

(iv) එසේ ක්‍රමවේදය සංශෝධනය කිරීම යෝග්‍යද;

(v) එම ක්‍රමවේදය සංශෝධනය කිරීම පිළිබඳව අයදුම්කරුවන් දැනුම්වත් කළේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට කටයුතු කරන අතරතුර අයදුම් කළ නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨතා ලේඛනය පෙරදාතම් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම නිලධාරින්ගේ නම් කවරේද;

(iii) එසේ පෙරදාතම් කිරීමේ පදනම කවරේද;

(iv) අනතුරුව, කිසිදු දැනුම්දීමකින් හා හේතු දැක්වීමකින් තොරව සම්මුඛ පරීක්ෂණය කල් දැමුවේද;

(v) මේ වනවිට සම්මුඛ පරීක්ෂණයේ තත්ත්වය කවරේද;

(vi) සම්මුඛ පරීක්ෂණය ඉදිරියේදී පවත්වන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සහකාර පොලිස් අධිකාරි තනතුරේ රාජකාරි ආවරණය කිරීමට ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලයේ නිලධාරින් යෙදවූයේද;

(ii) එසේ නම්, එම රාජකාරි කවරේද?

යන්නත් වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

782/2020

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— වාර්මාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2011 සිට 2013 දක්වා වූ කාලය තුළ මුසලි ප්‍රදේශයේ පිහිටි කුඩා වැව් ප්‍රතිසංස්කරණය කළ බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම කාලය තුළ ප්‍රතිසංස්කරණය කළ වැව් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වැව්වල නම් කවරේද;

(iv) එම වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආයෝජනය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2014 සිට 2015 දක්වා වූ කාලය තුළ ප්‍රතිසංස්කරණය කළ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වල නම් කවරේද;

(iii) එම වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආයෝජනය කළ මුළු මුදල කොපමණද;

(iv) ඉහත කාලය තුළ මෙම වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ ආයතනය කවරේද;

(v) එම ආයතනය තෝරා ගනු ලැබූ ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 දෙසැම්බර් 07 සඳුදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

130/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන මහ නගර සභා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම මහ නගර සභා අතරින් කසළ ඉවත් කිරීම පෞද්ගලික ආයතන වෙත භාර දී ඇති මහ නගර සභාවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහ නගර සභාවල කසළ ඉවත් කිරීම භාරගත් පෞද්ගලික සමාගම්වල නම් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සමාගම් වෙත ගෙවා ඇති මුදල කොපමණද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම පළාත් පාලන ආයතනවල සේවකයන් යොදවා සිය පළාත් පාලන බලප්‍රදේශයේ කසළ ඉවත් කරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

306/2020

ගරු වේලු කුමාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, කටුගස්තොට අධ්‍යාපන කලාපය තුළ 3 වර්ගයට (Type 3) අයත් පාසලක් වූ කසාවත්ත විද්‍යාලය පිහිටා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසලේ මේ වනවිට —

(i) අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව;

(ii) භාවිතයේ පවතින පන්ති කාමර සංඛ්‍යාව;

(iii) භාවිතා කරන මුළු බිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම පාසලේ භාවිතය සඳහා තිබූ ගොඩනැගිල්ලක්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් භාවිතයට නුසුදුසු බවට නිර්දේශ කර ඇති බවත්;

(ii) එම ගොඩනැගිල්ල භාවිතයෙන් ඉවත් කරන ලෙස දන්වා ඇති බවත්;

යන්නත් එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ වෙනුවෙන් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

432/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අඩු ආදායම්ලාභී පවුල්වලින් රජයේ විශ්වවිද්‍යාලවලට තෝරාගනු ලබන සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්ව ලබා දෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයේදී මහපොළ ශිෂ්‍යත්වය ලබා දුන් සමස්ත ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව;

(ii) එම ශිෂ්‍යත්වය ලැබීම සඳහා තිබිය යුතු අවම සුදුසුකම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මහපොළ ශිෂ්‍යත්වය ලැබීම සඳහා සුදුසුකම් තිබුනද එම ශිෂ්‍යත්වය නොලැබෙන සිසුන් පිරිසක් සිටින බව පිළිගන්නේද;

(ii) එවැනි සිසුන් සඳහා සාධාරණයක් ඉටු කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

454/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ - ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 493 විජිතපුර ග්‍රාම නිලධාරි වසමේ වත්මන් අග්‍රාමාත්‍යවරයා ධීවර අමාත්‍යවරයාව සිටි කාලයේ ආරම්භ කළ දියවර ධීවර ගම්මානයේ වත්මන් තත්ත්වය එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ගම්මානයේ ඉඩම්වලට ඔප්පු ලබා දීම සඳහා මූලික පියවර ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) එම ගම්මානයේ ඉඩම්වලට ඔප්පු ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

516/2020

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිබිල, මොණරාගල පාර, 1 කණුව, මඩමේවත්ත යන ලිපිනයේ පදිංචි පී.වී. වසන්ත රාණි මහත්මිය, ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් බිබිල රජයේ ගොවිපොළේ, පළාත් කෘෂිකර්ම ආයතනයේ කම්කරු තනතුරක 2017 වර්ෂයේ නොවැම්බර් සිට 2019 වර්ෂයේ දෙසැම්බර් දක්වා සේවය කර ඇති බවත්;

(ii) ඉහත සඳහන් සේවා කාලය තුළ ඇය අඛණ්ඩව දින 180ක් සේවය කර ඇති බවත්;

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/2019 ට අනුව ඇය ස්ථිර සේවයට හිමිකම් ලබා ඇති බවත්;

(iv) නමුත්, 2020 වර්ෂයේ ජනවාරි සිට ඇයගේ සේවය අත්හිටුවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සිය රැකියාව අහිමි වීම නිසා ඉතා අසරණභාවයට පත්ව සිටින වසන්ත රාණි මහත්මිය නැවතත් සේවයේ පිහිටුවීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

716/2020

ගරු යදාමිණී ගුණවර්ධන මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ නඩු තීන්දු ලබා දෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 24 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ නඩු තීන්දු සිංහල භාෂාවෙන්ද ලබා දීමට කටයුතු කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

726/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල, පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලග්ගල ප්‍රාදේශීය රෝහල අලුතින් ඉදිකිරීම සඳහා රජය විසින් වියදම් කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එම රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගත හැකි රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) රෝහල සඳහා අනුමත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම රෝහලේ සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) රෝහල සඳහා අනුමත හෙද කාර්ය මණ්ඩලය කොපමණද;

(vi) මේ වනවිට එම රෝහලේ සේවයේ නිරත හෙද කාර්ය මණ්ඩලය කොපමණද;

(vii) දැනට එම රෝහලේ පවත්වාගෙන යනු ලබන සායන වර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

759/2020

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට නිල වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති උතුරු පළාත තුළ පිහිටි වනාන්තරවලට අයත් භූමි ප්‍රමාණය කොපමණද;

(ii) වර්ෂ 1982 වනවිට ප්‍රකාශ කර තිබූ වනාන්තරවලට අයත් භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම භූමි ප්‍රමාණයන් අතර වෙනසක් පවතින්නේ නම්, එම වෙනසට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තෝරගත් ප්‍රදේශයක් රක්ෂිත වනාන්තරයක් ලෙස ගැසට් කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) 2009 වර්ෂයේ සිට මේ වනතෙක් උතුරු පළාතට අදාළව අලුතෙන් වන ආරක්ෂණය සඳහා නිකුත් කළ ගැසට් පත්‍ර සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 දෙසැම්බර් 08 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

22/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020.08.31 දින වනවිට ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වී ඇති මූල්‍ය සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් හා අධ්‍යක්ෂ මණ්ඩලයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය යහපාලන රජය බලයට පත් වූ දින සිට 2020.08.31 දින දක්වා මූල්‍ය අර්බුදවලට ලක් වූ මූල්‍ය සමාගම් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) එම එක් එක් මූල්‍ය සමාගමේ තැන්පතු පවත්වාගෙන ගොස් ඇති තැන්පත්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම මූල්‍ය සමාගම්වල තැන්පත්කරුවන්ට සාධාරණය ඉටු කිරීම සඳහා මෙතෙක් ගනු ලැබූ සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

108/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා ලබා දෙන ත්‍රිපෝෂ පෝෂණ අතිරේකය ප්‍රමාණවත් හා විධිමත් පරිදි නොලැබෙන බවත්;

(ii) ළමා මන්දපෝෂණය සැලකිය යුතු මට්ටමක පැවතීමට මෙම තත්වයද එක් හේතුවක් බවත්;

(iii) ඒ හේතුවෙන්, දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල් දැඩි අපහසුතාවයට පත්වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දැනට වාර්ෂික ත්‍රිපෝෂ නිෂ්පාදන ධාරිතාවය කිලෝග්‍රෑම් කොපමණද;

(ii) පරිභෝජනය සඳහා වර්ෂයකට අවශ්‍ය ත්‍රිපෝෂ කිලෝග්‍රෑම් ප්‍රමාණය කොපමණද යන්න ගණනය කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රටේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් පරිදි ත්‍රිපෝෂ නිෂ්පාදනයට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කුමන ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

434/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) ඩෙංගු රෝගය විවිධ අවස්ථාවලදී ශ්‍රී ලංකාව තුළ වර්ධනය වන බව එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) 2019 වසර තුළ ඩෙංගු රෝගය හේතුවෙන් අහිමි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු රෝගය මර්දනය සඳහා ජාතික හා ප්‍රාදේශීය වශයෙන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) ප්‍රාදේශීය ඩෙංගු මර්දන වැඩපිළිවෙළ සඳහා බඳවාගත් කම්කරුවන් පිරිසක් සිටින බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඔවුන්ගේ සේවය අඛණ්ඩව ලබා ගැනීමට සැලැස්මක් තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

455/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිළිවෙලින් අංක 225, 226 සහ 227 දරන ග්‍රාම නිලධාරි වසම්වල ජීවත්වන ජනතාව වන අලි තර්ජනය නිසා තමන්ගේ ඉඩකඩම් අතහැර වෙනත් ස්ථානවලට සංක්‍රමණය වන තත්ත්වයක් උදාවී ඇති බවත්;

(ii) එම වසම්වල ජීවත්වන ජනතාව අලි වැටක් ඉදිකර දෙන ලෙස බලධාරින් දැනුවත් කළ ද මේ වනතෙක් ඊට විසඳුමක් ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

546/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බද්දේගම, අම්බලන්තොට, බෙන්තර - ඇල්පිටිය, කරන්දෙණිය සහ බලපිටිය යන මැතිවරණ බල ප්‍රදේශවල ජීවත්වන ජනතාව බරපතල පානීය ජල ගැටලුවකට මුහුණ දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී ප්‍රශ්නයට විසඳුම් සඳහා බද්දේගම ජල යෝජනා ක්‍රමයේ දෙවන අදියර සඳහා ඉදිරි අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කරන්නේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) ඉහත කී ප්‍රදේශවල පවතින පානීය ජල ගැටලුව සඳහා විසඳුමක් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

591/2020

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පවතින එකම උප අධ්‍යාපන කලාපය, පොතුවිල් උප අධ්‍යාපන කලාපය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කලාප කාර්යාලයේ, සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් දෙදෙනාට පරිපාලන වගකීම් නොපැවරීමට හේතු කවරේද;

(ii) විධිමත්ව බලය පවරන ලද උප අධ්‍යාපන කලාපයක් වුවත්, මෙලෙස නිලධාරින් නොසලකා හැරීමට ලක්වීම පිළිගත හැකිද;

(iii) මෙම තත්ත්වය හේතුවෙන්, සුළු රාජකාරියක් සඳහා වුවද පොතුවිල් කොට්ඨාසයේ ගුරුවරුන්ට අක්කරපත්තුව කලාප කාර්යාලයට යාමට සිදු වී ඇති බැවින්, එම ගැටලුව විසඳීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පොතුවිල්හි සියලු පාසල් ඒකාබද්ධ කර පොතුවිල් ප්‍රදේශයට වෙනම අධ්‍යයන කලාපයක් පිහිටුවීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එය පිහිටවනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) විවිධ ජන වර්ග එක්සත් කිරීම රජයේ අරමුණ වුවද, මුස්ලිම් පාසල් අක්කරපත්තුව කලාපය සමඟත්, දෙමළ පාසල් තිරුක්කෝවිල් කලාපය සමඟත්, සිංහල පාසල් අම්පාර කලාපය සමඟත් වෙන් වෙන් ව ඒකාබද්ධ කර ඇති බවත් එතුමා දන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

711/2020

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට වැසී ගොස් තිබෙන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) පෙර පාසල්වල පහසුකම් වැඩි කිරීම සඳහා රජය විසින් ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෙර පාසල් ගුරුවරුන් සඳහා වැටුප් හෝ දීමනා ගෙවීමේ විධිමත් ක්‍රමවේදයක් තිබේද;

(ii) පෙර පාසල් ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයට හෝ ඒ හා සමාන වෙනත් ඒකාබද්ධ සේවයකට අන්තර්ග්‍රහනය කර ගැනීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) පෙර පාසල් ගුරුවරුන්ගේ බඳවා ගැනීම් හා ඔවුන්ගේ සුදුසුකම් තීරණය කිරීම ආදිය සම්බන්ධයෙන් යම් නියාමන ක්‍රමවේදයක් තිබේද;

(iv) පෙර පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගෙන් අය කරනු ලබන ගාස්තු නියාමනය කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පෙර පාසල්වල අධ්‍යාපනය විධිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව යෝජනා කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

727/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) එවකට බලයේ සිටි ජනාධිපතිවරයා විසින් 2013 ජනවාරි මස 15 වන දින අගවිනිසුරු ධූරයට ව්‍යවස්ථානුකූලව පත් කරන ලද මොහාන් පීරිස් මහතාගේ පත්කිරීම, පසුව අවලංගු හා බල ශුන්‍ය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) මොහාන් පිරිස් මහතාගේ අගවිනිසුරු ධූරය සඳහා වූ එම පත්කිරීම, අවලංගු හා බලශුන්‍ය කර ඇත්තේ කවුරුන් විසින්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 දෙසැම්බර් 09 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

61/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තනතුරු දරන ලද/දරන පුද්ගලයන්ගේ නම් හා ඔවුන්ගේ තනතුරු කවරේද;

(ii) එම කාලසීමාව තුළ එක් එක් පුද්ගලයා නිරත වූ නිල විදේශ සංචාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් නිලධාරියාගේ නිල විදේශ සංචාර සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම නිල විදේශ සංචාර තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවට අත් වූ ප්‍රතිලාභ කවරේද;

(v) යම් ප්‍රතිලාභයක් ලබා තිබේ නම්, ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

478/2020

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවේ ආරම්භ කර ඇති ධීවර වරාය සංඛ්‍යාව;

(ii) ඒ අතරින් වැඩ නිම වී ඇති ධීවර වරාය සංඛ්‍යාව;

(iii) අළුතින් ඉදිකිරීමට අපේක්ෂිත ධීවර වරාය සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මාවැල්ල නැංගුරම්පොළ, රැකව නැංගුරම්පොළ, හම්බන්තොට ධීවර වරාය සහ ගන්දර ධීවර වරාය යන වරායවල්වල වර්තමාන තත්ත්වය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

520/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුන්නෙකුඩා, කෝට්ටෙයිකල්ලාරු ආදි ප්‍රදේශවල සඳහා මෝයකටවල් (Bay Mouth Gates) ඉදිකර බෝට්ටු නැවැත්වීමේ පහසුකම් සැලසීම මඟින් දේශීය ධීවරයින් බොහෝ දෙනෙකුට ප්‍රයෝජන ගත හැකි බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම ප්‍රදේශවල මෝයකටවල් ඉදිකිරීමට ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

529/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම් අතරින් මේ වනවිට ස්ථිර ග්‍රාම නිලධාරින් සිටින වසම් සංඛ්‍යාව කොපමණද;

(iv) ස්ථිර ග්‍රාම නිලධාරින් නොමැති වසම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ස්ථිර ග්‍රාම නිලධාරින් නොමැති වසම්වල ඇති ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

542/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා විසින් ආරම්භ කරන ලද මධ්‍ය මහා විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍ය මහා විද්‍යාලවල 6 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කර ගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා විසින් ආරම්භ කරන ලද මධ්‍ය මහා විද්‍යාලයක් කුලියාපිටිය මැතිවරණ බලප්‍රදේශයේ පිහිටුවා ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2015 සිට 2018 දක්වා ඉහත (ආ) හි සඳහන් විද්‍යාලයේ 6 ශ්‍රේණිය සඳහා ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඇතුළත් කර ගන්නා ලද ඉහත එක් එක් සිසුවා 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම විද්‍යාලයට ශිෂ්‍යත්ව කඩඉම් ලකුණට පහළ ලකුණු ලැබූ සිසුන් කොපමණ සංඛ්‍යාවක් ඇතුළත් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

557/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාළු විදීමේ ක්‍රීඩාවේ යෙදීම සඳහා විදේශීය සංචාරකයන් විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට පැමිණෙන බවත්;

(ii) ඔලිම්පික් ක්‍රීඩාවක් වන මෙම ක්‍රීඩාව ශ්‍රී ලංකාවේ සිදු කිරීමට නොහැකි වන පරිදි නීති සැකසී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයන්ට නැවත එම ක්‍රීඩාවේ යෙදීමට හැකි වන පරිදි ඉහත නීති සංශෝධනය කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

653/2020

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට එල්ලල රක්ෂිතය, හොරොව්පතාන රත්මලේ රක්ෂිතය සහ මහදිවුල්වැව අඩියාහින්න රක්ෂිතය ඇතුළු රක්ෂිත වනාන්තර කිහිපයක වන විනාශයන් සිදු කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම වන විනාශයන් සිදු කළ පුද්ගලයන්ට විරුද්ධව පියවර නොගැනීමට හේතු කවරේද;

(ii) එම රක්ෂිතවල විනාශ කර ඇති වන භූමි ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

(iii) මේ වනවිට වන විනාශය රැල්ලක් ලෙස ශ්‍රී ලංකාවේම ව්‍යාප්තවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

728/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හීංගහ පානීය ජල යෝජනා ක්‍රමයේ වැඩ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම යෝජනා ක්‍රමයේ ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු කවරේද;

(iii) එම යෝජනා ක්‍රමය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iv) ගිවිසුම් ප්‍රකාරව මෙම යෝජනා ක්‍රමයේ වැඩ අවසන් කළ යුතු දිනය කවරේද;

(v) නියමිත දිනට මෙම යෝජනා ක්‍රමයේ වැඩ අවසන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 දෙසැම්බර් 10 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

262/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බුද්ධ ධර්මය ප්‍රායෝගික විෂයයක් බවත්;

(ii) එය විභාග ඉලක්කගත විෂයයක් වශයෙන් මේ වනවිට පාසල් හා දහම් පාසල් තුළ ඉගැන්වීම් කටයුතු කරන බවත්;

(iii) නමුත්, ඉහත ක්‍රමවේදයන් තුළින් බුද්ධ දර්ශනය ඇසුරින් ජීවිතයට ලබාගත හැකි විනය, හික්මීම ඇතුළු යහපත් මානුෂීය ගුණධර්ම ප්‍රමාණවත් පරිදි සමාජගත නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) බුද්ධ දර්ශනයේ ප්‍රායෝගික භාවිතයන් ඉගැන්වීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

424/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගය ඉදිකිරීමේදී එම මාර්ගය නිශ්චය කර ගැනීම සඳහා මැනුම් 3ක් සිදුකර ඇති අතර ඉන් 3 වැනි මැනුමට අදාළව, මාර්ගය ඉදිකිරීමට තීරණය කර ඇති අතර බෙලිගමුව - ගලේවෙල - දඹුල්ල කොටසේ ඉදිකිරීම්, ඉහළ ආර්ථික වටිනාකමකින් යුක්ත ඉඩම් හරහා සිදු වන නිසා වැඩි වන්දි ප්‍රමාණයක් ගෙවීමට සිදු නොවන්නේද;

(ii) ඉහත දුම්රිය මාර්ගය ඉදිකිරීම නිශ්චය කර ගැනීම සඳහා කරන ලද තුන්වන මැනුම අනුව මෙම දුම්රිය මාර්ගය ඉදිකිරීමට තීරණයකර තිබුනද එහි පළමු මැනුම අනුව ඉහත දුම්රිය මාර්ගය ඉදිකිරීමෙන් මෙම මාර්ගය ඉදිකිරීමේදී සිදු වන හානි අවම වී වන්දි ගෙවීමත් අවම නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

522/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිටින කිරි ගොවීන් සංඛ්‍යාව හා ඔවුන් විසින් ඇතිකරනු ලබන කිරි එළ හා මී ගවයින් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිස්ත්‍රික්කයේ වැඩිම කිරි ගොවීන් සිටින ප්‍රදේශ කවරේද;

(ii) ඔවුන්ට රජයෙන් කිරි ගවයන් ලබා දී ඇත්නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) අවසන් වරට එසේ, කිරි ගවයන් ලබා දුන් දිනය සහ ඔවුන් අතරින් මේ වනවිට ජීවත්ව සිටින සංඛ්‍යාව කොපමණද;

(iv) කිරි ගවයන් පෝෂණය සඳහා රජයෙන් තෘණ භූමි ලබා දී තිබේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(v) කිරි ගොවීන්ට ලබා දීමට තෘණ භූමි හඳුනාගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ සමස්ත දෛනික කිරි නිෂ්පාදනයෙන් පොළොන්නරු දිස්ත්‍රික්කයේ කිරි ගොවීන්ගේ දායකත්වය ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

(ii) දිස්ත්‍රික්කයේ කිරි ගවයන්ගෙන් දෛනිකව ගන්නා කිරි ප්‍රමාණය කොපමණද;

(iii) එම කිරිවලින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය / මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් මිලදී ගනු ලබන දෛනික කිරි ප්‍රමාණය සහ ලීටරයකට ගෙවන මිල කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

567/2020

ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) මිනිස් සමේ පැහැය වෙනස් කරන / පැහැපත් කිරීමේ (සුදු පැහැගැන්වීමේ) ඖෂධ, පෙති, එන්නත් හා ආලේපන විශාල වශයෙන් ශ්‍රී ලංකාව තුළ අලෙවි කරමින් පවතින බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එසේ අලෙවි කරන ඖෂධ අතරින් ආනයනය කරනු ලබන ඖෂධ සම්බන්ධයෙන් නියාමනය සිදු කරන ආයතනය;

(ii) එම නිගමනයට අදාළ නීතිය;

කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ඖෂධ නියම කිරීම සිදු කරන බොහෝ දෙනෙකුට වෛද්‍ය විද්‍යාත්මක දැනුමක් නොමැති බව පිළිගන්නේද;

(ii) එම ඖෂධ භාවිතයෙන් කෙටි කාලීනව විවිධ ආසාත්මිකතා ඇති වන බව වාර්තා වී තිබේද;

(iii) ඖෂධ භාවිතයේ ප්‍රතිඵලයක් ලෙස දිගුකාලීනව භයානක රෝගී තත්ත්වයන් ඇතිවිය හැකි බවට පළ වන වෛද්‍ය මතයන් පිළිබඳව අවධානය යොමු කර තිබේද;

(iv) එසේ නම්, එහිදී අනාවරණය වූ කරුණු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම ඖෂධ භාවිතයෙන් අහිතකර ප්‍රතිඵල ජනිත වේ නම්, එය වැළැක්විය යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

579/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කයෙන් පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාණය උතුරු පළාතේ සමස්ත භූමි ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙලෙස ඉඩම් පවරා ගැනීමේදී, පෞද්ගලික ඉඩම්, කෘෂිකාර්මික වැව්, කෘෂිකාර්මික ඉඩම් සහ පශු සම්පත් සඳහා වූ තෘණ භූමි ඉඩම් ද පවරාගෙන ඇති අතර එය ජනතාවගේ ජීවනෝපායට මෙන්ම සහජීවනයටද අහිතකර ලෙස බලපෑම් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) උක්ත ඉඩම් පවරා පවරා ගැනීමේදී දිස්ත්‍රික් ලේකම්වරයාගේ, ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහ පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා නොගැනීමට හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

602/2020

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය "යහපාලන" රජය සමයේ රාජ්‍ය ආයතන තුළ සිදුවූ දූෂණ හා අක්‍රමිකතා පිළිබඳව සොයා බැලීම සඳහා පත් කළ විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේදී සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළව සිදුවූ බරපතල දූෂණ හා අක්‍රමිකතාවයන් ගණනාවක් පිළිබඳව විමර්ශනය කළ බව ජනමාධ්‍ය මගින් වාර්තා වූ බවත්;

(ii) එම විමර්ශන අතර පිළිකා නාශක ඖෂධ මිලදී ගැනීමේ ටෙන්ඩර, ෆ්ලුක්ලොක්ෂකින් (flucloxacillin) නම් ප්‍රතිජීවක ඖෂධය මිලදී ගැනීමේ ටෙන්ඩරය හා මාලඹේ නෙවිල් ප්‍රනාන්දු රෝහල රජයට පවරා ගැනීමට අදාළව රාජ්‍ය මුදල් අවභාවිතය පිළිබඳ විමර්ශන පැවති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම විමර්ශනවලදී හෙළිදරව් වූ තොරතුරු හා ඉහත සඳහන් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශ කවරේද යන්න පිළිබඳව සොයා බැලීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම ජනාධිපති කොමිෂන් සභා වාර්තා අනුව ලබා දී ඇති නිර්දේශ කවරේද;

(iii) එහිදී කවර පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර තිබේද;

(iv) එම නිර්දේශ පිළිබඳව අමාත්‍යාංශය විසින් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

760/2020

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බදුල්ල සිට මහනුවර දක්වා දිවෙන දැනට පවතින මාර්ගයට විකල්පයක් ලෙස කි.මී. 20 - 30 ක අඩු දුරකින් යුත් බදුල්ල සිට මහනුවර දක්වා නව මහාමාර්ගයක් ඉදිකිරීම යන මැයෙන් එවකට මහාමාර්ග අමාත්‍යතුමා විසින් 2004.10.29 දිනැති අංක 2004/10 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය අදියර දෙකක් යටතේ ඉදිකිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අනුමැතිය ලබා දී තිබේද;

(ii) මේ වනවිට එම මාර්ගයේ වැඩ අවසන් කර ඇති දුර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දැනට එම මාර්ගයේ වැඩ කටයුතු නවතා ඇති බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) එවකට සංවර්ධන සංග්‍රාමය යටතේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන තිබූ මෙම මාර්ගයේ වැඩ කටයුතු මේ වනතෙක් අවසන් කර නොතිබීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) විශේෂ ව්‍යාපෘතියක් යටතේ හෝ මාර්ගයේ වැඩ කටයුතු අවසන් කර ජනතාවට මාර්ග පහසුකම් සැලසීමට ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

880/2020

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ගම්පෙරළිය" වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී තිබුණේද;

(ii) එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

(iii) එම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද කාල පරිච්ඡේදය කවරේද;

(iv) එම වැඩසටහන සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(v) එම වැඩසටහන මඟිගින් ක්‍රියාත්මක කරන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(vi) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(vii) "ගම්පෙරළිය" වැඩසටහන ක්‍රියාත්මක කළ කාලසීමාව තුළදී එම වැඩසටහනට අදාළව, අදාළ විෂය භාර අමාත්‍යවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සඳහා දරන ලද මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) "ගම්පෙරළිය" වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද එක් එක් ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද අරමුණු ඉටු වූ බවට අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහතික විය හැකිද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?